**විෂය** - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**ශ්‍රේණිය** - 8

**මාසය** - දෙසැම්බර් **සතිය** - 02 **ක්‍රියාකාරකම් අංකය** - 46

**සැකසුම- එම්.එච්.ඩී.මධුමාලි ,ර/ඇඹි/ගශේයාය විද්‍යාලය ,ඇඹිලිපිටිය**

## 6 - අන්තර්ජාලයේ සැරිසරමු

### 6.2 වෙබ් පිටු නිර්මාණය - IV (වෙබ් පිටුවකට ලැයිස්තු ඇතුලත් කිරීම)

**ශිෂ්‍ය කාර්යය -**

- පහත දී ඇති සටහන හොඳින් කියවා අවබෝධ කරගන්න.

  - එකිනෙක අතර සම්බන්ධයක් ඇති අයිතම සමූහයක් අනුපිළිවෙලින් දැක් වූ විට ලැයිස්තුවක් නම් වේ.
  - වෙබ් පිටුවකට අංකිත ලැයිස්තු මෙන්ම අංකිත නොවන ලැයිස්තු ඇතුලත් කල හැකිය.

| අංකිත ලැයිස්තු | අංකිත නොවන ලැයිස්තු |
|---|---|
| 1. අමල් | ❖ අමල් |
| 2. නයනා | ❖ නයනා |
| 3. සාමා | ❖ සාමා |
| 4. නුවන් | ❖ නුවන් |

  - බුලට් (සංකේත) ලැයිස්තුවක් සඳහා <ul> </ul> උසුලනය ද අංක ලැයිස්තුවක් සඳහා <ol> </ol> උසුලනය ද යොදාගනී.
  - පේළියෙන් පේළිය වෙන්කිරීම සඳහා අදාල අයිතම <li>..........</li> තුල දැක්විය යුතුය.

  උදා-

| | |
|---|---|
| <ul><br><li> සිංහල </li><br><li> දෙමළ </li><br><li> බර්ගර් </li><br></ul> | • සිංහල<br>• දෙමළ<br>• බර්ගර් |

- අමාරු/අපහසු පාඩම් කොටස් වැඩිහිටියෙකු/ ගුරුවරයෙකු ගෙන් විමසා අවබෝධ කරගන්න.
- පහතින් දක්වා ඇති මාර්ගගත හෝ මුද්‍රිත ඉගෙනුම් ආධාරක මගින් පාඩමට අදාළ ඉගැන්වීම්, පාඩම් ලබාගෙන ඉගෙනගන්න.
- ඔබ සතුව පරිගණකයක් තිබේනම් වැඩ පොතෙහි 6.4 ක්‍රියාකාරකමෙහි පිටු අංක 54 සහ 55 ට අදාළ පියවර අනුගමනය කරන්න.

- ක්‍රියාකාරකම් සිදුකිරීමේදී ඔබට එන ගැටළු ඔබේ යහළුවන්, වැඩිහිටියන් හා ගුරුවරුන් සමඟ සාකච්ඡා කර විසඳුම් ලබාගන්න.

**මෙම පාඩමට අදාළව උපකාර කරගත හැකි ඉගෙනුම් ආධාරක -**

- e නැණපියස - https://www.enenapiyasa.lk/lms/mod/resource/view.php?id=10960
- වෙනත් -
    - Youtube- https://youtu.be/kTYhORK2hM4
    - HTML පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත වෙබ් අඩවි -
      https://www.w3schools.com
      (Menu → HTML Reference මත ක්ලික් කරන්න → අවශ්‍ය html Tag එක මත ක්ලික් කරන්න. → it Yourself මත ක්ලික් කර වෙනස්කම් සිදු කර බලන්න.)
      http://www.tutorialspoint.com/html
    - සවියෙන් පෙරට - අපි එකට e- ඉගෙනුම් පාසල හොරණ අධ්‍යාපන කලාපය -
      https://drive.google.com/file/d/1k_FJOEo8NMtekAoSMZqZiFuaI1glMdW2/view?usp=sharing

**මෙම පාඩම තුළින් ලබාගත හැකි ඉගෙනුම්ඵල -**

- වෙබ් පිටුවකට ලැයිස්තු ඇතුලත් කරන ආකාරය හඳුනා ගනියි.
- එදිනෙදා කාර්යයන් පහසුවෙන් ඉටුකර ගැනීමට තොරතුරු තාක්ෂණය යොදා ගනියි.
- හොඳින් කියවා සහ සවන් දී අවබෝධයෙන් යුතුව පිළිතුරු සපයයි.

- **ඇගයීම්/ තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘතිය -**

*1.* පහත සඳහන් අංකිත ලැයිස්තුව වෙබ් පිටුවකට ඇතුලත් කරන්න .

1. Banana
2. Mango
3. Apple
4. Orange